# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 823/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 16/05/2024 පැය 1310

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01.** **2024.05.15වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 75 | 1408 | යකඩ බැරල් 10<br>තඹ දඟර 02<br>බූලි 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **නීති නිරෝධි ලෙස බලපත්‍ර නොමැතිව මී ගවයින් ප්‍රවාහනය සිදු කල සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2024.05.15 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත උඩවලව පොලිස් වසමේ උඩවලව වැව් බැම්ම මහවැලි අධිකාරී මුරපොල අසල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව හිංසාකාරී ලෙස ගැහැණු මී ගවයින් 08 දෙනෙකු සහ පිරිමි මී ගවයින් 02 ක් ලොරි රථයකින් ප්‍රවාහනය සිදු කල සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන උඩවලව පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 36ක් හා 64 ක් වන නාරම්මල හා තිස්සමහාරාම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** උඩවලව පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03.** **නීති විරෝධි ලෙස ව්‍යාජව මුද්‍රණය කරන ලද මුදල් නෝට්ටු සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2024.05.15 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වීරකැටිය පොලිස් වසමේ මීගස්ආර, මැදමුලන ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **නීති විරොධී ලෙස ව්‍යාජව මුද්‍රණය කරන ලද රුපියල් 1000 මුදල් නෝට්ටු 09ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වීරකැටිය පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 32 ක් වූ මුදමුලන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වීරකැටිය පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**